(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 70.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 මැයි මස 18 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

11/'15

1.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා නාවික හමුදාව මඟින් ඉටු කරන ලද සාගර ආරක්ෂා කටයුතු, මුහුදු කොල්ලකෑම් වැළැක්වීම සහ දේශීය හා විදේශීය නැව්වලට ආරක්ෂාව සැපයීම යන සේවා 2012 සැප්තැම්බර් 18 දින සිට ඇවන්ට්ගාර්ඩ් සමාගම වෙත පවරා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) නාවික හමුදාව සහ ඇවන්ට්ගාර්ඩ් සමාගම සහ සීමාසහිත රක්නා ආරක්ෂණ ලංකා සමාගම අතර පවත්නා ගිවිසුම කුමක්ද; එහි ප්‍රධාන කොන්දේසි කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඇවන්ට්ගාර්ඩ් සමාගම සහ නාවික හමුදාව අතර පවත්නා සේවා සම්බන්ධතාවය කවරේද;

(ii) ඇවන්ට්ගාර්ඩ් සමාගමේ ආරක්ෂක සේවා කටයුතු සඳහා නාවික හමුදාවේ නිලධාරීන් සහ ආයුධ යොදවන්නේද;

(iii) එසේ නම්, ඒ කවර පදනමකින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) වර්ෂ 2012 සිට 2015 දක්වා,

(i) ඇවන්ට්ගාර්ඩ් සමාගම ලැබූ ආදායම;

(ii) ඔවුන් රජයට ගෙවූ බදු මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) සුවිශාල ලාභයක් ලබන මුහුදු ආරක්ෂක සේවය නාවික හමුදාවෙන් ඉවත් කිරීමට හා රාජ්‍ය දේපළ අවභාවිතයට හිටපු ආරක්ෂක ලේකම්වරයා ගත් තීරණය නිවැරදි කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

360/'15

2.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015දී පාසල් සිසුන්ට පාවහන් ලබාදීමට ටෙන්ඩර කැඳවනු ලැබුවේද;

(ii) ඒ සඳහා අයදුම් කළ සමාගම් කවරේද;

(iii) එම සමාගම් මූලික සුදුසුකම් සපුරා තිබේද;

(iv) සමාගම් ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) පසුගිය වසරවලදී සමාගම් කිහිපයකට ලබා දුන් ටෙන්ඩරය මෙවර DSI සමාගම වෙත පමණක් ලබාදී තිබේද;

(vi) වැඩිම මිල සඳහන් ටෙන්ඩරය ඉදිරිපත් කළේ DSI සමාගමද;

(vii) DSI ටෙන්ඩරය සඳහා කැබිනට් අනුමතිය ලබා ගෙන ඇත්තේ අවම මිල යැයි සඳහන් කිරීමෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ටෙන්ඩරය, පසුගිය වසරවල සමාගම් කිහිපයකට ලබා දුන්නේද;

(ii) එසේ නම්, ඒ මන්ද;

(iii) පසුගිය වසරේදී DSI සමාගමෙන් ලබාගත් පාවහන් යුගල ලක්ෂ 04, එම සමාගමෙන්ම සපයා තිබුණේද;

(iv) නොඑසේ නම්, වෙනත් සමාගමකින් පාවහන් යුගල 50,000ක් සපයා තිබුණේද;

(v) එවැනි තත්ත්වයක් යටතේ, එම ටෙන්ඩරය තනි සමාගමකට ලබා දුන්නේ මන්ද;

(vi) DSI වෙත ටෙන්ඩරය ලබාදීම හරහා මුදල් වංචාවක් හෝ රජයට පාඩුවක් නොවූ බවටත් සහතික විය හැකිද;

(vii) වංචාවක් සිදු වූ බවට හෙළිදරව් වුවහොත්, වැරදිකරුවන්ට දඬුවම් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

390/'15

3\.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, සුනාමියෙන් පීඩාවට පත් ජනතාව සඳහා සෞදි අරාබියානු සංවර්ධන අරමුදලින්, අක්කරපත්තුව, නොරොච්චොලේ ගම්මානයේ නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලද බවත්;

(ii) එම නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරයේදී ප්‍රතිලාභීන් අතර බෙදාදීමට ප්‍රථමයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් අංක 178/2008 දරන නඩු නියෝගයක් මත නිවාස බෙදාදීම අත්හිටුවන ලද බවත්;

(iii) 2009.12.02 දින ප්‍රකාශයට පත්කරන ලද ඉහත නඩුවේ තීන්දුව ලබාදී වසර පහක කාලයක් ගත වී ඇති නමුත්, ඒ අනුව නිවාස බෙදාදීම සිදුකර නොමැතිවීමෙන් එම දේපළ සියල්ල මිනිස් පරිහරණයට නුසුදුසු අන්දමින් පරිහානියට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අ(iii)හි සඳහන් නඩු තීන්දුව අනුව කටයුතු කිරීමට නොපමාව උපදෙස් දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

398/'15

4\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වසරේ සත්‍ය නැතහොත්, ඇස්තමේන්තු කළ දළ ජාතික නිෂ්පාදනය කොපමණද;

(ii) 2016 වසරේ පුරෝකථනය කළ දළ ජාතික නිෂ්පාදනය කොපමණද;

(iii) අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කරන සම්ප්‍රදායික ක්‍රමය යටතේ, වර්ෂ 2013 සිට 2016 දක්වා අයවැයෙන් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට වෙන් කළ මුදල්, දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2016 අයවැයෙන් හඳුන්වා දුන් අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කරන නවීන ක්‍රමය යටතේ වර්ෂ 2013 සිට 2016 දක්වා අයවැයෙන් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට වෙන් කළ මුදල් දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

437/'16

5.

ගරු විජිත හේරත් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ඉවත්කර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතට ගෙන තිබේද;

(ii) එසේ නම්, එමඟින් සේවකයන්ට මෙතෙක් ලබා දුන් රු. 4000/= පැමිණීමේ දීමනාව, වසර අවසාන ප්‍රසාද දීමනාව සහ රු.40,000/= මරණාධාර දීමනාව ආදී දීමනා ගණනාවක් අහිමි වන බව දන්නේද;

(iii) එම දීමනා නව ආයතනය මඟින් සේවකයන් හට ලබා දීමට හෝ වෙනත් ආකාරයකින් ප්‍රතිපූර්ණය කිරීමට එකඟ වන්නේද;

(iv) එසේ නොවේ නම්, සේවකයන්ට බලවත් අසාධාරණයක් සිදුවන බව පිළිගන්නේද;

(v) එම අසාධාරණය වැළැක්වීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් මෙම ආයතනය ඉවත්කළ පසු තනි ආයතනයක් ලෙස පවත්වා ගැනීම වෙනුවට ඩිපෝ 50ක් ලෙස යළි ඇරඹීමට සැලසුමක් සකස්කර තිබේද;

(ii) එසේ නම්, මෙම ඩිපෝ 50ට අලුතින් විදුලිය, ජලය, දුරකථන හා අනිකුත් වියදම් දරමින් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල පිරිවැයක් අවශ්‍යවන බව පිළිගන්නේද;

(iii) එවැනි පිරිවැයක් දැරීම වෙනුවට වෙනත් විකල්පයක් වෙත යොමුවීමට අදහස් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

440/'16

6.

ගරු ඩී. වී. චානක මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාස සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් 250,000/=ක වටිනාකමින් යුත් නිවාස වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබුවේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

(ii) එම ඉඩම් ලබාදීමේදී දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව මඟින් අදාළ ඉඩම් කැබලි හඳුනාගැනීම සිදුකර තිබේද;

(iii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ප්‍රතිලාභීන්ගේ නම්, ලිපිනයන් සහ තෝරාගත් ක්‍රමවේදය කවරේද;

(v) ප්‍රතිලාභීන් තෝරාගැනීමට සහභාගි වූ රාජ්‍ය නිලධාරීන්ගේ නම් කවරේද;

(vi) තෝරාගත් ප්‍රතිලාභීන් ඉඩම් හිමිකමක් ලැබීමට නියම සුදුස්සන් බවට සෑහීමට පත්විය හැකිද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

444/’16

7.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි මස සිට විදුලි බිල්පත් ගාස්තුව කිසිදු දැනුම්දීමකින් තොරව වැඩිකර තිබේද;

(ii) ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලෝතියාව, වැල්මිල්ල හංදිය යන ලිපිනයෙහි පදිංචි සී. හෙට්ටිආරච්චි මහතාගේ නිවසෙහි 2015 ජනවාරි මස විදුලි බිල්පතේ (ගිණුම් අංක 3195478318), ඒකක 94 සඳහා ගාස්තුව රු.892.40ක් වූ අතර 2015 පෙබරවාරි මස විදුලි බිල්පතේ ඒකක 90ක් සඳහා ගාස්තුව රු.1,308.55ක් වී ඇත. මේ අනුව එක් මාසයක් තුළ එම විදුලි පාරිභෝගිකයාගේ විදුලි බිල රු.416.15කින් වැඩි වී ඇති බවත්;

(ii) එසේම, කුලියාපිටිය, හොරම්බාව යන ලිපිනයෙහි පදිංචි එම්. බී. එස්. පී. ප්‍රනාන්දු මහතාගේ නිවසෙහි 2014 දෙසැම්බර් මස විදුලි බිල්පත ඒකක 62ක් සඳහා ගාස්තුව රු.283.15 වූ අතර 2015 ජනවාරි මස විදුලි බිල්පත ඒකක 61ක් සඳහා ගාස්තුව රු.571/-ක් ලෙස වැඩි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මෙම විදුලි බිල්පත් ගාස්තු වැඩිවීම සිදු වී ඇත්තේ කෙසේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

446/’16

8.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, නාවලපිටිය අඩවියේ, සමනලගම ප්‍රදේශයේ පයිනස් ගස් 7000ක් කපා ඉවත් කරමින් සිටින බවත්;

(ii) නාවලපිටිය, මාපාකන්ද අක්කර 200කට සහ දොලොස්බාගේ, මල්ගොල්ල අක්කර 50කට අයත් පයිනස් ගස් පුද්ගලික වෙළෙඳුන් මඟින් කපා ඉවත් කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇති බවත්;

(iii) දොලොස්බාගේ, පරගල කොටසේ ගස් 2500ක් පමණක් ඉවත් කිරීමට අවසර ලබාගෙන ඇතත්, මේ වනවිට අනවසරයෙන් ගස් 12,000ක් පමණ කපා ඉවත් කොට ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සියළුම ගස් ඉවත් කිරීම සඳහා අවසර ලබාදීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදයන් සහ ඒවාට සම්බන්ධ නිලධාරීන්ගේ නම් කවරේද;

(ii) එමඟින් රජයට අයවිය යුතු විශාල මුදලක් අහිමි වී ඇති බව පිළිගන්නේද;

(iii) එම වංචා සහගත ක්‍රියාවලට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව ගනු ලබන නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

455/'16

9\.

ගරු සිසිර ජයකොඩි මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තමන් අධ්‍යක්ෂ ධුරයක් දරන සමාගමක වංචාවක් සිදුවූ බවට පැමිණිලි කළ බ්‍රයන් ෂැඩික් නමැති පුද්ගලයාගෙන් ප්‍රකාශ ලබාගැනීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන ඒකකයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි මෙවන් සිල්වා සහ පොලිස් පරීක්ෂක ගුණතිලක යන නිලධාරීන් 2015 දෙසැම්බර් මස ඕස්ට්‍රේලියානු සංචාරයක නිරත වූ බව දන්නේද;

(ii) එම සංචාරයට වැය වුණු මුදල කොපමණද;

(iii) එම සංචාරයට වැය කරනු ලැබුවේ මහජන මුදල්ද;

(iv) මීට පෙර පෞද්ගලික ආරවුලක පැමිණිලිකරුවෙකුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීම සඳහා විශේෂ විමර්ශන ඒකකයේ නිලධාරීන් විදේශගත වී ඇත්නම්, එවැනි අවස්ථා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) (අ)(i)හි පැමිණිල්ල පිළිබඳ විමර්ශන කටයුතු පැමිණිලිකරුගේ ඉල්ලීම මත පොලිස්පතිවරයා විසින් අපරාධ පරීක්ෂණ කොට්ඨාසයෙන් විශේෂ විමර්ශන ඒකකයට මාරු කළ බව දන්නේද;

(ii) එම පැමිණිල්ල එසේ මාරු කිරීමට බලපෑ හේතුව කවරේද;

(iii) මීට පෙර පැමිණිල්ල පිළිබඳ විමර්ශන කටයුතු පැමිණිලිකරුගේ ඉල්ලීම මත අපරාධ පරීක්ෂණ කොට්ඨාසයෙන් විශේෂ විමර්ශන ඒකකයට මාරු කරන ලද අවස්ථා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

503/'16

10\.

ගරු චතුර සංදීප සේනාරත්න මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ භාෂා පරිවර්තක සේවයේ විශේෂ පන්තියට උසස් කිරීමේ විභාගය 1999 වසරින් පසු මෙතෙක් පවත්වා නොමැති බවත්;

(ii) ඒ හේතුකොට ගෙන එකී විශේෂ පන්තියේ තනතුරු මේ වනවිට මුළුමනින්ම පුරප්පාඩු වී ඇති බවත්;

(iii) වසර 16කට වැඩි කාලයක් පුරා පවතින එකම උසස්වීමේ අවස්ථාවද අහිමි කිරීමෙන් නිලධාරීන්හට බලවත් අසාධාරණයක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් 2006.01.01 දින සිට එම සේවයේ විශේෂ පන්තිය සේවා තත්ත්වයෙන් පහත හෙළන ලද බවත්;

(ii) ඒ අනුව, දීපව්‍යාප්ත සේවා මට්ටමේ තිබූ එම පන්තිය 2006 වසරේ සිට කළමණාකරන සහකාර අධි පන්තියටද පහළින් ස්ථානගත කරන ලද බවත්;

(iii) එම තත්ත්වය නිලධාරීන් සේවය හැරයාමටත්, උග්‍ර නිලධාරී හිඟයක් ඇති කිරීමටත් හේතුවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) උසස්වීමේ අවස්ථාව අහිමි වූ එම නිලධාරීන්ට ලබාදෙන සහනය කවරේද;

(ii) නව සේවා ව්‍යවස්ථා කෙටුම්පතෙන් විශේෂ පන්තිය සඳහා 2006 වසරට පෙර පැවති සේවා තත්ත්වය නැවත ලබාදීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම ප්‍රතිපාදනයන් වහා ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

373/'15

11.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 වසර සඳහා පාසල් නිල ඇඳුම් රෙදි මිලදී ගැනීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ දිනය කවරේද;

(ii) ඒ කවර රෙදි ප්‍රමාණයක් මිලදී ගැනීමටද;

(iii) ඒ සඳහා වෙන් කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම කැබිනට් පත්‍රිකාව අනුමත වූ දිනය කවරේද;

(v) ඒ අනුව ප්‍රසිද්ධියේ මිල ගණන් කැඳවීම් සිදු කළේද;

(vi) එසේ නම්, මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවන් හා ඔවුන්ගේ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) 2016 වසර සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය නිල ඇඳුම් රෙදි මිලදී ගත් සැපයුම්කරුවන් කවරේද;

(viii) මිලදී ගත් රෙදි ප්‍රමාණය කවරේද; ඒ සඳහා ගෙවූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රෙදි මිලදී ගැනීම වෙනුවට පාසල් නිල ඇඳුම් වවුචරයක් ලබාදීමට තීරණය කළ දිනය කවරේද;

(ii) පාසල් නිල ඇඳුම් රෙදි 25%ක් අවභාවිත වන බවට හෙළිවූයේ යැයි අධ්‍යාපන අමාත්‍යවරයා පවසන සමීක්ෂණ වාර්තාව සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වසරේදී ගරු පාඨලී චම්පික රණවක අමාත්‍යතුමන්ගේ සංකල්පයක් යටතේ ආරම්භ කරන ලද දැනට ඔබගේ අමාත්‍යාංශය යටතේ පවතින සීමාසහිත පොලිප්ටෝ ලංකා (පෞද්ගලික) සමාගම විසින් 2010 වසරේ දී සාර්ථක ලෙස පොලිතීන් භාවිතා කර පෙට්‍රල් නිපද වූ බව දන්නේද;

(ii) එයින් වසර හයකට ආසන්න කාලයක් ගත වී ඇතත්, පොලිතින් භාවිතා කර නිපදවන පෙට්‍රල් වෙළඳපොළට නිකුත් කිරීමට නොහැකි වූයේ මන්ද;

(iii) පොලිතින් භාවිතා කර නිපදවන පෙට්‍රල් වෙළඳපොළට නිකුත් කිරීමට අපේක්ෂා කරන වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුව විසින් 2016.03.08 වැනි දින සම්මත කරන ලද යෝජනාවේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ඡේදය ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු ගිවිසුම (අපරානුමත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝග,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 ජනවාරි 01 දිනැති අංක 1947/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.04.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ, 32 වැනි වගන්තිය සමඟ කියවනු ලබන 22 වැනි වගන්තිය යටතේ ඊතයිල් මධ්‍යසාර මත සුරාබදු සංශෝධනය කිරීම සහ ඊතයිල් මධ්‍යසාර ආනයනය කිරීමට බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මාර්තු 02 දිනැති අංක 1956/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.04.06 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 988 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 07 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 07 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 01002 "අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 12,000,000 සිට රු. 250,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 20,000,000 සිට රු. 275,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 08 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 08 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 21302 “පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 2,500,000,000 සිට රු. 3,950,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000 සිට රු. 3,000,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 1,900,000,000 සිට රු. 2,500,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 09 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 09 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 22302 “ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - ශ්‍රී ලංකා නාවික හමුදාව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| අයිතමය | | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 338,000,000 සිට රු. 345,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 10 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 10 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| අයිතමය | | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,800,000,000 සිට රු. 1,200,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 1,000,000,000 සිට රු. 1,500,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 11 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 11 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 "කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | **අයිතමය** | **සංශෝධනය** |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000 සිට රු. 308,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 12 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

# 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 12 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 “ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 120,000,000<br>රු. 80,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 40,000,000<br>රු. 80,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7),— 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ අංක 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## උපලේඛනය

## 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධාන

2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2015 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

### කණ්ඩායම් විධාන අංක 01

2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතලවලට අනුව රවී කරුණානායක වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් ආණ්ඩුවේ අනුමතියට යටත්ව මේ සමඟ දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල විෂය අංක 12101, 16401, 16501, 19601, 19701 සහ 19801ට අදාළ වන්නා වූ 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනය තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක III හි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 12101 | 5,500,000 | 30,000,000 | - | - | 15,000,000 | 350,000,000 | 1 |
| 2 | දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | 16401 | 2,000,000 | 0 | 10,000 | 0 | 10,000,000 | 0 | 2 |
| 3 | ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | 16501 | 2,000,000 | 0 | 20,000 | 0 | 10,000,000 | 0 | 3 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 4 | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 19601 | 4,000,000 | 20,000,000 | - | - | - | - | 4 |
| 5 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 19701 | 30,000,000 | 10,000,000 | 10,000,000 | 6,000,000 | 90,000,000 | 40,000,000 | 5 |
| 6 | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 19801 | - | - | - | - | 20,000,000 | 23,000,000 | 6 |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග (අංක 1),— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග (අංක 2),— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ප්‍රමිති හා සේවා පනත යටතේ නියෝග,— 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 60 වැනි වගන්තිය යටතේ ආහාර සුරක්ෂිතතාව අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූලි 2 දිනැති අංක 1921/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ කරන නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අගෝස්තු 6 දිනැති අංක 1926/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වැනි වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 18 දිනැති අංක 1954/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*18.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල ඇතුළත් 13 සහ 17 වැනි වගන්ති සංශෝධනය කරමින් 2015 නොවැම්බර් 9 දිනැති අංක 1940/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*20.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ රීති,— 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සාදන ලදුව, 2015 ජූලි 21 දිනැති අංක 1924/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.23 දින ඉදිරිපත් කරන ලද 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (බලපත්‍ර) රීති සහ 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමේ අදහස පිළිබඳ දැනුම් දීමේ) රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*24.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 28 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 16 (ඇ) වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 973 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*